# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# කාර්ය මණ්ඩල පුරප්පාඩු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින්, ජාතික නෛතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) හට අනුකූල වන ආරක්ෂිත, ප්‍රවේශම් සහිත, කාර්යක්ෂම හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක්, මනාලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් යටතේ උපාය මාර්ගික සැලසුම්කරණය, වෘත්තීය මාර්ගොපදේශ හා දැඩි ආවේක්ෂණය තුළින් සහතික කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා කාර්යක්ෂම, උද්යෝගිමත් හා ස්වයං-අභිප්‍රේරිත සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි ඉතා ඉහළ සුදුසුකම් හා දීර්ඝ පළපුරුද්ද සහිත අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කාර්ය මණ්ඩල)

**තනතුරු කේතය : MM-1-1-PLA4 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MM 1-1) - රු. 91,690-10X2,440-15X3,450-164,240-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 205,510.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරු හට, දළ වශයෙන් රු. 85,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමි වේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම, සන්නිවේදන පහසුකම්.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 1**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර තුනකට (03) නොඅඩු කාලයක, භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගනතල, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, හෝ ඉංජිනේරු ධාරාවේ ප්‍රථම උපාධියක් සමග ගුවන් සේවා හි නියුක්ත රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටකට (08) නොඅඩු පළපුරුද්ද

**විකල්ප 2**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත්වීම සමග ගුවන් සේවාහි නිරත රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටක (08) පළපුරුද්ද

**විකල්ප 3**

තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් (NVQ) 7 තලයට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග ගුවන් සේවා හි නියුතු රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටක (08) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. අදාළ වන පරිදි, සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - විභාග), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - ප්‍රමිතීන්), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කාර්ය මණ්ඩලය), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර නොවන කාර්ය මණ්ඩලය) සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පියාසර පුහුණු) තනතුරක අවම වශයෙන් වසර හයක (06) සේවා පළපුරුද්ද.

සහ

2. පසුගිය වසර හය (06) සඳහා නිකැළැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම හා වර්තමාන තනතුර සඳහා වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම.

සහ

3. පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයෙහි සති හතරක (04) කාලයකට නොඅඩු ICAO අනුමත කළ පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

සහ

4. වාර්ෂික කාර්ය සාධන ඇගැයුම්වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## කළමනාකරු (නීති කටයුතු සහ බලාත්මක කිරීම්)

**තනතුරු කේතය : MM-1-1-DM-2, තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MM 1-1) - රු. 91,690-10X2,440-15X3,450-164,240-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 205,510.00
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම, සන්නිවේදන පහසුකම්.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් LLB උපාධිය හෝ නීතිඥ වෘත්තීය සුදුසුකම් සමග රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක නීති කටයුතු පිළිබඳ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු වසර අටක (08) පරිපාලන පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. සහකාර කළමනාකරු (නීති කටයුතු) ලෙස අවම වසර හයක (06) සේවා පළපුරුද්ද

සහ

2. නීතිඥයකු ලෙස වෘත්තීය සුදුසුකම් ලබා තිබීම

සහ

3. පසුගිය වසර හය (06) සඳහා නිකැළැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම හා වර්තමාන තනතුර සඳහා වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම.

සහ

4. පසුගිය වසර හය සඳහා වාර්ෂික කාර්ය සාධන ඇගැයුම්වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

**තනතුරු කේතය : MM-1-1-DM-3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MM 1-1) - රු. 91,690-10X2,440-15X3,450-168,240-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 205,510.00
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප 01**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් LLB උපාධියක් සමග නීතිඥ වෘත්තීය සුදුසුකම්

සහ

2. ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**විකල්ප 02**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් ආයතනික ලේකම්වරයෙකු වීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයක අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතා)

**තනතුරු කේතය : MA 5-3-AW තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040-15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව, 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00 වේ.
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන් හට දළ වශයෙන් රු. 215,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමි වේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප 01**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් යාන්ත්‍රික/ බලශක්ති/ ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ/ ගුවන්යානා ඉංජිනේරු විෂය ධාරාවේ වසර හතරකට (04) නොඅඩු ඉංජිනේරු ප්‍රථම උපාධියක් සමග වසරක (01) විධායක මට්ටමේ පළපුද්දක් තිබීම හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත සඳහන් ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**විකල්ප 02**

B.1.1 හෝ B.1.2 කාණ්ඩ යටතේ ගුවන්යානා නඩත්තු බලපත්‍රයක් හිමි අයෙකු වීම සමග ගුවන් සේවාවක හෝ පියසර පාසලක ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවකු ලෙස වසර දෙකක (02) පළපුරුද්ද.

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර නොවන කාර්ය මණ්ඩල)

**තනතුරු කේතය : MA 5-3-PL2 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040-15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව, 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක වේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00 වේ.
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන් හට දළ වශයෙන් රු. 40,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමි වේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගනතල, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හෝ ඉංජිනේරු විෂය ධාරාවේ වසර තුනකට (03) නොඅඩු විද්‍යා ප්‍රථම උපාධියක් සමග වසරක (01) විධායක මට්ටමේ පළපුද්දක් තිබීම හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත සඳහන් ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් සේවා ආරක්ෂණ)

**තනතුරු කේතය : MA 5-3-AS2 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040-15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව, 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක වේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00 වේ.
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන් හට දළ වශයෙන් රු. 25,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමි වේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක් සමග වසරක (01) විධායක මට්ටමේ පළපුද්දක් තිබීම හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

## සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පහසුකම්)

**තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රු. 79,440-10X2,040-15X2,230-144,440-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව, 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 166,117.00 වේ.
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍ය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වෙනත් ඕනෑම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

## සහකාර කළමනාකරු (සිවිල් ගුවන් සේවා ප්‍රවර්ධන)

**තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (JM 1-1) - රු. 72,650-10X1,360-18X2,040-122,970-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව - 2027-01-01 දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 158,133.00
- වෙනත් ප්‍රතිලාභ - සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ ක්‍රමය, මරණාධාර ක්‍රමය, ප්‍රසාද දීමනා, නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම,

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන මාධ්‍ය, අලෙවිකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වෙනත් ඕනෑම උපාධියක්.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

**විකල්ප 2**

කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA1-2) II ශ්‍රේණියක තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| වයස් සීමාව | | |
|---|---|---|
| **තනතුර** | **වයස් සීමාව** | **සටහන** |
| ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක/ කළමනාකරු/ සිවිල් ගුවන් සේවා පරීක්ෂක | අවුරුදු 22 සිට අවුරුදු 45 | මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ, දේශීය ගුවන් සේවා හා පියාසර පාසල්වල අයදුම්කරුවන් හට අදාළ නැත. |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / සහකාර කළමනාකරු (සිවිල් ගුවන් සේවා ප්‍රවර්ධන) | අවුරුදු 22 සිට අවුරුදු 45 | මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් හට අදාළ නොවේ. |

- වැඩිදුර විස්තර, රැකියා විස්තරය, විශේෂ තාක්ෂණ දීමනාව සඳහා අවශ්‍ය සුදුසුකම් හා **සම්මත අයදුම්පත්‍ර ආකෘතීන්** CAASL ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026-01-19 දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් employment@caa.lk විද්‍යුත් තැපැල මගින් පමණක් එවිය යුතු අතර, විද්‍යුත් ලිපියෙහි ශීර්ෂ තීරුවෙහි අයදුම්කරනු ලබන තනතුර/තනතුරු අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. සියලුම අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු ලැබේ.
- අයදුම්කරුවන් විසින්, අයදුම්කරනු ලබන තනතුර/තනතුරු සඳහා වන සුදුසුකම් තහවුරු කරනු පිණිස සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.
- **අදාළ සම්මත අයදුම්පත්‍ර ආකෘතිවලින්** යොමු කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රාජ්‍ය ආයතන වල අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- තනතුරු කිහිපයකට අයදුම්කරන්නේ නම් එක් එක් තනතුරක් සඳහා වෙන් වශයෙන් අයදුම්පත් එවිය යුතුය.
- සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලබයි.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර,**
**කටුනායක.**

**2026-01-04**